# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2019 අගෝස්තු
# නව හා පැරණි නිර්දේශ

මෙවර විභාගය නව නිර්දේශය හා පැරණි නිර්දේශය වශයෙන් විභාග දෙකක් පැවැත්වෙයි. අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී තමන් ඉදිරිපත්වන විෂය නිර්දේශය කුමක් ද යන්න නිශ්චිතව හඳුනාගෙන ඒ අනුව අයදුම්පත් සම්පූර්ණ කළ යුතු ය.

උක්ත විභාගයට පෞද්ගලිකව පෙනී සිටීම සඳහා වන අයදුම්පත් 2019 පෙබරවාරි 13 වන දින සිට මාර්තු 01 වන දින තෙක් භාරගනු ලැබේ. සෑම පෞද්ගලික අයදුම්කරුවකු ම මෙම නිවේදනය සම්පූර්ණයෙන් ම හොඳින් කියවා අවබෝධ කර ගෙන තම අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත්‍රයේ **නගර අංකය හා විෂය අංක** සටහන් කිරීමේ දී නිවැරදි අංක ම සටහන් කිරීමට විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය. උපරිම වශයෙන් ප්‍රධාන විෂයන් 03 ක් සඳහා පෙනී සිටීමට අයදුම්කරුවන්ට ඉඩ දෙනු ලැබේ.

02. **අයදුම්පත් ඃ**

පෞද්ගලික අයදුම්කරුවන්, විභාගය ඉල්ලුම් කිරීමට මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත උපයෝගී කර ගත යුතු වේ.

**පෞද්ගලික අයදුම්කරුවන් ලෙස විභාගය ඉල්ලුම් කළ හැක්කේ පාසලෙන් අස්වීම් සහතිකය ලබා ඇති අයදුම්කරුවන්ට පමණි. පාසලේ ඉගෙන ගනිමින් ම පෞද්ගලික අයදුම්කරුවන් ලෙස විභාගයට අයදුම් කිරීම සපුරා තහනම් වේ. එසේ පෙනී සිටීමක් අනාවරණය වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කොට ඉදිරි විභාග සඳහා පෙනී සිටීම ද තහනම් කරනු ලැබේ.**

2.1 (අ) **(13) සාමාන්‍ය ඉංග්‍රීසි විෂය ඃ**

ප්‍රධාන විෂයන් තුන සහ සාමාන්‍ය පොදු පරීක්ෂණයට අමතරව අයදුම්කරුවන්ට සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා ද ඉල්ලුම් කළ හැකි ය. **මේ සඳහා ලබාගන්නා ප්‍රතිඵලය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා උපයෝගී කරගනු නොලැබේ.** මෙම විෂය සඳහා ලබාගන්නා ශ්‍රේණිය අ.පො.ස.(උ.පෙළ) සහතිකයේ ඇතුළත් කෙරේ. මෙම විෂය තනි විෂයක් වශයෙන් වුව ද අයදුම් කිරීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) **(12) සාමාන්‍ය පොදු පරීක්ෂණය ඃ**

යම් අයදුම්කරුවකු ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රවේශය අපේක්ෂා කරන්නේ නම් ඔහු/ඇය මෙම විෂය අනිවාර්යයෙන් ම සමත් විය යුතු ය.

(ඇ) විෂය අංක 28, 52, 53, 54, 55, 56, 57, 58, 59, 65 හා 66 යන විෂයයන් සඳහා ලිඛිත පරීක්ෂණයන්ට ඉදිරිපත් වන සියලු ම අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත සහ ප්‍රායෝගික යන කොටස් දෙකට ම ඉදිරිපත් වන අපේක්ෂකයින්ට පමණක් උක්ත විෂයන්වල ප්‍රතිඵල නිකුත් කරනු ඇත.

2.2 විභාග අයදුම්කරුවන් මෙම නිවේදනයේ දක්වා ඇති DP/AL/2019/5 ආදර්ශ ආකෘතියට අනුව සෙ.මී. 28 x සෙ.මී. 21 ප්‍රමාණයේ සුදු කඩදාසියක අයදුම්පත් සකස් කළ යුතුයි. 01 සිට 12 තෙක් කරුණු කඩදාසියේ මුල් පිටුවේ ද 13 සිට 15 තෙක් කරුණු එම කඩදාසියේ ම පසු පිටුවේ ද, වශයෙන් එක කඩදාසියක දැක්විය යුතු ය. **අයදුම්පත් 2019.03.01 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල්, තැ.පෙ. 1503, කොළඹ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ආදර්ශ ආකෘති අයදුම්පත්‍රයට වෙනස් වන හෝ නියමිත දිනට පසුව තැපැල් කරන හෝ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.3 අවසාන දිනට පෙර විභාග ගාස්තු ගෙවා රිසිට්පත් ලබාගෙන තිබුණ ද අවසන් දිනයෙන් පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව වැඩිදුරටත් දන්වමි.

2.4 **එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පත්‍ර එකකට වඩා ඉදිරිපත් කරන අවස්ථාවල දී සියලු ම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එම අයදුම්කරුවන් සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගනු ලැබේ. විභාග ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු වුව ද මෙවැනි වංචනික ක්‍රියාවක් ඔප්පු වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කර අදාළ නීත්‍යානුකූල පියවර ක්‍රියාත්මක කරනු ලැබේ.**

03. එක් ලියුම් කවරයක් තුළ බහා එවිය හැක්කේ එක් අයදුම්පතක් පමණි. **අයදුම්පත බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2019 අගෝස්තු - නගර අංකය ............ හා නගරය ..............."** යනුවෙන් සඳහන් කළ යුතු ය. නගර අංකය සහ නගරය මෙම තිත් ඉරමත පැහැදිලිව සඳහන් කළ යුතු ය. යම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිට වීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටියහොත් ආසන්න නගරයකට යොමු කිරීමට සිදුවෙයි.

U.U.A.6.3.2016.AL Paper AD

04. වෙනත් ආයතන විසින් සකස් කොට මුද්‍රණය කර ඇති ආකෘති පත්‍ර මේ සඳහා යොදාගනු ලබන්නේ නම් මෙම දැන්වීමෙහි දක්වා ඇති විෂය අංක හා නගර අංකවලටත් ආදර්ශ ආකෘති පත්‍රයේ දක්වා ඇති අනෙක් සියලු ම තොරතුරුවලටත් අනුකූල විය යුතු ය. එසේම වෙනත් පෞද්ගලික මුද්‍රණායතනවල පිළියෙල කරනු ලබන අයදුම්පත් ආකෘතිවල, විෂය ලේඛනවල හෝ නගර අංකවල හෝ මුද්‍රිත වැරදි තොරතුරු සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව වග කියනු නොලබන අතර, විභාග දෙපාර්තමේන්තුවේ නිල නිවේදනය ලෙස සැලකෙන මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් ආකෘතියට ම අනුකූලව මෙහි සඳහන් තොරතුරු ද උපයෝගි කරගෙන විභාගයට අයදුම් කිරීම අයදුම්කරුවන්ගේ වගකීමකි.

05. මෙම විභාගය සංවිධානය කිරීම සඳහා පරිගණක යන්ත්‍ර උපයෝගී කර ගන්නා බැවින් ඔබ තෝරා ගන්නා විෂයන්වල **විෂය අංක** හා තෝරා ගන්නා නගරයෙහි **නගර අංකය** ඉතා වැදගත් වේ. **එබැවින් අයදුම්පත තැපැල් කිරීමට පෙර විශේෂ අවධානයකින් එය නැවත වරක් කියවා එහි ලියා ඇති විෂය අංක, නගර අංකය සහ තොරතුරු නිවැරදි දැයි පරීක්ෂා කර බැලිය යුතු අතර, තවත් අයකු ලවා පරීක්ෂා කරවීම ද ඉතා වැදගත් වේ.**

**කිසිදු හේතුවක් නිසා විභාග මධ්‍යස්ථානය, ඉල්ලුම් කරන ලද විෂයන් හෝ ඉල්ලුම් කරන ලද මාධ්‍යය හෝ පසුව වෙනස් කරනු නොලැබේ. එබැවින් ඔබගේ අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කළ යුතු ය.**

06. ඔබ ඉදිරිපත් කරන අයදුම්පතෙහි සඳහන් තොරතුරු හා විභාගයට පෙනී සිටීමට ඔබට ලැබෙන ප්‍රවේශ පත්‍රය සම්බන්ධ ව කිසියම් විමසීමක් කරන්නේ නම් ඔබගේ විභාග ප්‍රවේශ පත්‍රය ලැබුණු වහා ම එම ප්‍රවේශ පත්‍රය ද රැගෙන පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව වෙත පැමිණිය යුතු ය.

**07.** **පෞද්ගලික අයදුම්කරුවන් තම ස්ථිර පදිංචි ලිපිනය ලිවිය යුතු අතර අධ්‍යාපනය ලබන පෞද්ගලික හෝ ජාත්‍යන්තර පාසලේ නම සහ ලිපිනය නොලිය යුතු ය. ඔවුන් තම පෞද්ගලික දුරකථන අංකය ලිවිය යුතු ය.**

08. ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අයදුම්කරුවන් වෙත ලබා දෙන ප්‍රවේශ පත්‍රයේ සඳහන් දිනයේදී ම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය. එම දිනයේදී ඉදිරිපත් වීමට නොහැකි වූ අයදුම්කරුවන්ට වෙනත් අවස්ථාවකදී ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

09. **අනන්‍යතාව ඔප්පු කිරීම**

විභාග ශාලාවේදී අයදුම්කරුවන් තම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. විභාගයට පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම තම අනන්‍යතාව ඔප්පු කළ යුතුයි.

ජාතික හැඳුනුම්පතක් නොමැති අයදුම්කරුවකු වේ නම් ඒ සඳහා ග්‍රාම නිලධාරී මගින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් වෙත අයදුම්පතක් ඉදිරිපත් කර තම ජාතික හැඳුනුම් පත සකස් කර ගත යුතු ය.

10. මෙම විභාගය සඳහා රජයේ පාසල්වලින්, ගාස්තු අයකරන / නොකරන රජය අනුමත පෞද්ගලික පාසල්වලින් සහ අනුමත පිරිවෙන්වලින් පළමු වරට සහ දෙවන වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් හැර අනෙකුත් සියලු ම අයදුම්කරුවන් නියමිත විභාග ගාස්තු ගෙවිය යුතු වේ. එසේ ගාස්තු ගෙවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. මෙම විභාගය සඳහා අයදුම්කරනු ලබන **විශේෂ අවශ්‍යතා** සහිත අයදුම්කරුවන් වේ නම් මෙම පුවත්පතෙහි **"විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ට සහන සැලසීම"** යන ශීර්ෂ පාඨය යටතේ ඇති දැන්වීමේ සඳහන් අයදුම්පත්‍රයක් එහි ඇති උපදෙස්වලට අනුව සකස් කර ඉදිරිපත් කළ යුතු ය.

**සටහන :** ගෙවන ලද විභාග ගාස්තු සම්පූර්ණයෙන් හෝ අඩක් හෝ ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයකට මාරු කිරීමක් හෝ කරනු නොලැබේ.

මෙම විභාගයට අයදුම් කිරීමෙන් අනතුරුව එක ප්‍රශ්න පත්‍රයකට හෝ ප්‍රශ්න පත්‍රයක කොටසකට හෝ පෙනී නොසිටි අපේක්ෂකයින් පමණක් විභාගයට පෙනී නොසිටි අපේක්ෂකයින් සේ සලකනු ලැබේ. එවැනි අපේක්ෂකයන්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපාන විභාග වාරය අවලංගු නොවන බැවින්, ඒ සඳහා වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම කිසිසේත් ම අවශ්‍ය නොවේ. කිසිදු විෂයකට පෙනී නොසිටි බව ඔප්පු කිරීමට ඇති එක ම සාක්ෂිය වන්නේ තමන් වෙත නිකුත් කර ඇති ප්‍රවේශ පත්‍රය ආරක්ෂා කර තබා ගැනීම පමණි.

**මෙම විභාගය මගින් නව හා පැරණි විෂය නිර්දේශවලට අනුව විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගන්නා ක්‍රමවේදය පිළිබඳ ව ඉදිරියේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිවේදනය කරනු ඇත.**

උක්ත කරුණු සම්බන්ධයෙන් යම් විමසීමක් කළ යුතු නම් පහත සඳහන් දුරකථන අංකවලට අමතන්න.

දුරකථන අංක : 011-2784208 / 011-2784537

ෆැක්ස් අංක : 011-2784422

U.U.A.6.3.2016.AL Paper AD

යොමු අංකය : 6/3/AL/2019
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ.පෙ. 1503, කොළඹ.
2019.02.11

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

DP/AL/2019/5

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2019 අගෝස්තු

## බාහිර අයදුම්කරුවන් සඳහා අයදුම්පත්‍රය

(මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර මේ සමග ඇති උපදෙස් හොඳින් කියවිය යුතු ය.
මෙය තම අත් අකුරෙන් ම සම්පූර්ණ කළ යුතු ය.)

[ ]

**(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)**

01. **විභාගයට පෙනී සිටීම සඳහා තෝරාගත් නිර්දේශය :** [ ]
**(නව නිර්දේශය ද පැරණි නිර්දේශය ද යන වග)**

02. විභාගයට පෙනී සිටීම සඳහා තෝරාගත් දිස්ත්‍රික්කය : [ ]

තෝරාගත් නගරය : [ ]

[ | | ] **නගර අංකය**

03. සම්පූර්ණ නම : **(උප්පැන්න සහතිකය අනුව සම්පූර්ණ නම ලියන්න.)**

(i) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : ..................................................................................................
..................................................................................................

(ii) සිංහලෙන් / දෙමළෙන් : ..................................................................................................
..................................................................................................

04. ස්ථිර පදිංචි ලිපිනය හා දුරකථන අංකය : දුරකථන අංකය : [ | | | | | | | | | ]

(i) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්
..................................................................................
..................................................................................
..................................................................................

(ii) සිංහලෙන් / දෙමළෙන්
..................................................................................
..................................................................................
..................................................................................

05. (i) උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

(ii) 2019.01.01 දිනට වයස : අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

06. භාෂා මාධ්‍යය : සිංහල [2] දෙමළ [3] ඉංග්‍රීසි [4]

07. 2019 වසරේදී විභාගයට පෙනී සිටින විෂයන්, මාධ්‍යය හා විෂය අංක : (හොඳින් පරීක්ෂා කර බලා නිවැරදිව සටහන් කරන්න.) මාධ්‍ය දෙකකින් ඉදිරිපත් වන්නේ නම් පමණක් එක් එක් මාධ්‍යය අදාළ කොටුවෙහි සඳහන් කරන්න. එසේ නොමැති නම් එම කොටුව හිස්ව තබන්න.

| විෂය | මාධ්‍යය | විෂය අංකය |
|---|---|---|
| i. .................................................. | | |
| ii. .................................................. | | |
| iii. .................................................. | | |
| iv. සාමාන්‍ය පොදු පරීක්ෂණය | | |
| v. සාමාන්‍ය ඉංග්‍රීසි | | |

(iv සහ v දක්වන විෂයයන්වලට පෙනී සිටින්නේ නම් පමණක් විෂය අංකය කොටුව තුළ ලියන්න.)

08. ඉල්ලුම් කරන විෂයන් ගණන : [ ]
**(ඉලක්කමෙන්)**

09. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | ]
**(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අනෙක් පිටුවේ අදාළ කොටුවේ අලවන්න.)**

10. ගෙවන ලද විභාග ගාස්තු රු.: .................................................................... [ ]
**(අකුරෙන්)** **(ඉලක්කමෙන්)**

11. ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ [0] ස්ත්‍රී [1]

12. පෙනී සිටින වාරය : [ ]
**(ඉලක්කමෙන්)**

U.U.A.6.3.2016.AL Paper AD

13. හඳුනා ගැනීමේ සහතිකය ඃ

මෙම අයදුම්කරු / කාරිය මගේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පදිංචිකරුවකු/කාරියක බවත් ඉහත 03, 04 සහ 09 යන කොටුවල සඳහන් තොරතුරු අදාළ ලේඛන අනුව නිවැරදි බව ද ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බව ද සහතික කරමි. ඔහු/ඇය වෙත පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත /වලංගු විදේශ ගමන් බලපත්‍රය /වලංගු රියදුරු බලපත්‍රය හා එහි ඡායා පිටපත පරීක්ෂා කළෙමි. මාගේ කාර්යාලයේ ඇති ලිපි ලේඛන අනුව එය නිවැරදි ය. එහි ඡායා පිටපතක් ද ඉල්ලුම් පත්‍රයෙහි අදාළ කොටුවෙහි අලවා ඇත.

..................................
අයදුම්කරුගේ අත්සන

.......................................
ග්‍රාම නිලධාරීගේ අත්සන
නම ඃ ....................................................................................
(නිල මුද්‍රාව තබන්න)

ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා එහි අංකය .........................

ලිපිනය ඃ ...........................................................................
...........................................................................

දිනය ඃ .....................

14. ................................ දිනැති කුවිතාන්සි අංකය ............................. යටතේ .....................................................

තැපැල් / උපතැපැල් කාර්යාලයට රුපියල් ..................................................................... [ ] ගෙවන ලද
(අකුරින්) (ඉලක්කමින්)
බවට සහතික කරමි.

| විෂය ගණන | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| ගාස්තුව රුපියල් | 150/- | 200/- | 250/- | 350/- | 400/- |

මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ මුල් පිටපත නොගැලවෙන පරිදි මනාව මෙහි අලවන්න. අනිවාර්යයෙන් එහි ඡායා පිටපතක් ඔබ ළඟ තබා ගන්න. (අවම වශයෙන් මුදල් ගෙවූ රිසිට් පත්‍ර අංකය හා දිනය සුරැකිව තබා ගන්න.) **කුවිතාන්සියේ මුල් පිටපත අලවා නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

15. අයදුම්කරුගේ සහතිකය

........................................................................................................................................ ලිපිනයෙහි

පදිංචි.......................................................................................................... වන මම මෙම ඉල්ලුම්
(නම)
පත්‍රයේ දක්වා ඇති (1) සියලු ම තොරතුරු නිවැරදි හා සත්‍ය බව ද (2) විභාග පනතෙහි අයදුම්කරුවන් සඳහා වූ නීතිරීතිවලට එකඟ ව ඉන් බැඳී සිටින බව ද (3) මෙම විභාගය සඳහා වෙනත් අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර නොමැති බව ද (4) නියමිත විභාග ගාස්තු ගෙවන ලද වලංගු කුවිතාන්සියක් අයදුම්පත්‍රයට අමුණා ඇති බව ද (5) විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට එකඟ වන බව ද මෙයින් ප්‍රකාශ කරමි.

........................... ...................................
දිනය අයදුම්කරුගේ අත්සන

**ජාතික හැඳුනුම්පතේ /වලංගු විදේශ ගමන් බලපත්‍රයේ /වලංගු රියදුරු බලපත්‍රයේ ඡායා පිටපත මෙහි අලවන්න.**

## අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2019 අගෝස්තු
## අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා විභාග අයදුම්කරුවන්ට උපදෙස්

අංක 1 ඃ විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තු වන නිර්දේශය **නව ද පැරණි ද** යන්න පැහැදිලිව සඳහන් කරන්න. පසුව නිර්දේශ මාරු කිරීමට අවස්ථාවක් ලබා දෙනු නොලැබේ. අපේක්ෂයකු සම්පූර්ණ විභාගයම එකම නිර්දේශයක් යටතේ පෙනී සිටිය යුතුවන අතර යම් අයකු විෂයයන් කිහිපයක් එක් විෂය නිර්දේශයක් යටතේත් ඉතිරි විෂයන් අනෙක් විෂය නිර්දේශය යටතේත් පෙනී සිටියහොත් සම්පූර්ණ ප්‍රතිඵලය අවලංගු කරනු ලැබේ.

අංක 2 ඃ තෝරාගත් දිස්ත්‍රික්කය, නගරය සහ නගර අංකය ඃ

ඔබ විභාගයට පෙනී සිටීමට තෝරාගත් දිස්ත්‍රික්කය සඳහන් කරන්න. මෙම විභාගය පවත්වනු ලබන නගර අංක වෙනස් කර ඇති බැවින් ඒ ගැන විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය. ඔබ විභාගයට පෙනී සිටීමට තෝරාගත් නගරය සහ ඊට අදාළ නගර අංකය මෙම කොටුවෙහි සඳහන් කළ යුතු ය. **වැරදි නගර අංකයක් ඔබ විසින් සඳහන් කිරීමෙන් ඉතා දුර විභාග මධ්‍යස්ථානයක් ලැබීමට ඉඩ ඇත**. අදාළ නගර හා නගර අංක සහිත ලේඛනයක් මේ සමග අමුණා ඇත.

අංක 3 ඃ i උප්පැන්න සහතිකය අනුව සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න. මුලකුරු සමග නම නොලියන්න.
**උදාහරණ ඃ KULASOORIYAGE MAHESH SUJITH DE SILVA**

ii උප්පැන්න සහතිකය අනුව සම්පූර්ණ නම සිංහලෙන් ලියන්න.
**උදාහරණ ඃ කුලසූරියගේ මහේෂ් සුජිත් ද සිල්වා**

අංක 4 ඃ ලිපිනය (i) ඉංග්‍රීසියෙන් ද (ii) සිංහලෙන් ද ලියන්න.
මෙහි ස්ථිර ලිපිනය සඳහන් කරන්න. **කිසි විටෙකත් තාවකාලික පදිංචි ස්ථානයේ ලිපිනය හෝ පෞද්ගලික/ජාත්‍යන්තර පාසලේ ලිපිනය නොලියන්න.** ඔබගේ ජංගම හෝ ස්ථාවර දුරකථන අංකය අදාළ කොටුවේ ලියන්න.

අංක 5 ඃ උප්පැන්න සහතිකය අනුව උපන් දිනය ලියන්න.

අංක 6 ඃ භාෂා මාධ්‍යය ඃ

පෙනී සිටින භාෂා මාධ්‍යය දැක්වීම සඳහා අදාළ කොටුවේ (X) කතිරයක් යොදන්න.

උදා ඃ

| ☒ 2 | 3 | 4 |
|---|---|---|
| සිංහල | දෙමළ | ඉංග්‍රීසි |

අංක 7 ඃ 2019 වසරේදී විභාගයට පෙනී සිටීමට නියමිත විෂයන් හා පෙනී සිටින මාධ්‍යය

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද 2016/13 හා 2016.04.26 දිනැති චක්‍රලේඛයට අනුකූලව විෂයයන් තෝරා ගත යුතුයි. එම චක්‍රලේඛයේ සම්මත විෂය ධාරාවලට අනුගත නොවන වෙනත් විෂය සංකලනයන් තෝරා ගත් අවස්ථාවලදී අයදුම්කරුවන් " නිශ්චිත විෂය ධාරාවකට අයත් නොවන" යනුවෙන් හදුන්වා දෙන අතර විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී දිවයින් තරාව (Island Rank) හා දිස්ත්‍රික් තරාව (District Rank) නිකුත් කරනු නොලැබේ. එම චක්‍රලේඛයට පටහැනිව විෂය සංකලන තෝරා ගැනීමෙන් අයදුම්කරුවන්ට මුහුණ පෑමට සිදු වන දුෂ්කරතා පිළිබඳ ව වගකීමක් නොමැති බව කාරුණිකව සලකන්න. මෙම අයදුම්කරුවන්ට මෙම නිවේදනයේ දක්වා ඇති විෂයය ලේඛනයෙන් තම විෂයයන් තෝරා ගත හැකි ය. මෙම විභාගය සඳහා හර විෂයන් තුනක් තෝරා ගත යුතු අතර, **විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට අදහස් කරනු ලබන්නේ නම් සාමාන්‍ය පොදු පරීක්ෂණයට ද පෙනී සිට සමත් විය යුතුයි**. ඉහත විෂයන්ට අමතරව විෂයය අංක 13 සාමාන්‍ය ඉංග්‍රීසි විෂයට ද ඉල්ලුම් කළ හැකිය.

**වැදගත් ඃ එක් එක් විෂයට පෙනී සිටින මාධ්‍යය සඳහන් කිරීමේදී සිංහල නම් 2 ද, දෙමළ නම් 3 ද, ඉංග්‍රීසි නම් 4 ද අදාළ කොටු තුළ සඳහන් කරන්න.**

උදාහරණ ඃ

| **විෂය** | **මාධ්‍යය** | **විෂය අංක** |
|---|---|---|
| භෞතික විද්‍යාව | 2 | 01 |
| රසායන විද්‍යාව | 2 | 02 |
| ජීව විද්‍යාව | 4 | 09 |
| සාමාන්‍ය පොදු පරීක්ෂණය | 2 | 12 |
| සාමාන්‍ය ඉංග්‍රීසි | | 13 |

අයදුම්කරුවකුට පෙනී සිටිය හැකි උපරිම විෂයන් ගණන 05 කි.

**ඉතා වැදගත් ඃ**

i භෞතීය විද්‍යා විෂය ධාරාව යටතේ 07 ගණිතය විෂයට ඉල්ලුම් කළ නොහැකි ය.

ii විෂය අංක 14, 15, 16, 17, 18 හා 19 යන විෂයයන් අතුරෙන් **එක්** විෂයකට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

iii (65) ඉංජිනේරු තාක්ෂණවේදය හා (66) ජෛව පද්ධති තාක්ෂණවේදය යන විෂයයන් දෙකෙන් ඉල්ලුම් කළ හැක්කේ **එක්** විෂයකට පමණි.

iv (67) තාක්ෂණවේදය සඳහා විද්‍යාව විෂයට ඉල්ලුම් කළ හැක්කේ ඉංජිනේරු තාක්ෂණවේදය විෂය හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය හෝ ඉල්ලුම් කරන්නේ නම් පමණි.

U.U.A.6.3.2016.AL Paper AD

v ආගම් හා ශිෂ්ටාචාර විෂයන් අතුරෙන් යම් ආගමක් තෝරා ගන්නේ නම් ඊට අදාළ ශිෂ්ටාචාර විෂය තෝරා ගත නොහැකි ය. එසේම ශිෂ්ටාචාර විෂයන් තෝරා ගන්නේ නම් ඊට අදාළ ආගම විෂය තෝරා ගත නොහැකි ය.

vi 52 නර්තනය විෂය ඉල්ලුම් කිරීමේදී ඔබ ඉගෙනුම ලැබූ නර්තන වර්ගය සඳහන් කරන්න.
උදා ඃ ඔබ ඉගෙනුම ලැබුවේ උඩරට නර්තනය නම් 52A ලෙස ද, පහතරට නර්තනය නම් 52B ලෙස ද, සබරගමු නර්තනය නම් 52C ලෙස ද වශයෙනි. **මෙම වෙන් කර ගැනීම ප්‍රායෝගික පරීක්ෂණවලට පමණක් අදාළ වේ. ප්‍රවේශ පත්‍රයෙහි හා ප්‍රතිඵල ලේඛනයේ සඳහන් වනුයේ 52 නර්තනය (දේශීය) ලෙස ය.**

vii 54 - පෙරදිග සංගීත විෂය ඉල්ලුම් කළ හැක්කේ සිංහල මාධ්‍යයෙන් පමණි.

viii ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන ලද විෂයන් පසුව වෙනස් කිරීමට හෝ විභාග ශාලාවේ දී විෂයන් මාරු කිරීමට හෝ අමතර විෂයන්ට පෙනී සිටීමට හෝ ඉඩ දෙනු නොලැබේ. යම් හෙයකින් එසේ පෙනී සිටියහොත් එම අයදුම්කරුගේ ප්‍රතිඵල අවලංගු කිරීමට සිදුවනු ඇත.

**විෂයය ලේඛනය**

| විෂයය | විෂය අංකය | විෂය | විෂය අංකය |
|---|---|---|---|
| භෞතික විද්‍යාව | 01 | බෞද්ධ ශිෂ්ටාචාරය | 45 |
| රසායන විද්‍යාව | 02 | හින්දු ශිෂ්ටාචාරය | 46 |
| ගණිතය | 07 | ඉස්ලාම් ශිෂ්ටාචාරය | 47 |
| කෘෂි විද්‍යාව | 08 | ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | 48 |
| ජීව විද්‍යාව | 09 | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | 49 |
| සංයුක්ත ගණිතය | 10 | චිත්‍ර කලාව | 51 |
| උසස් ගණිතය | 11 | නර්තනය (දේශීය - උඩරට) | 52A |
| * සාමාන්‍ය පොදු පරීක්ෂණය | 12 | නර්තනය (දේශීය - පහතරට) | 52B |
| * සාමාන්‍ය ඉංග්‍රීසි | 13 | නර්තනය (දේශීය - සබරගමු) | 52C |
| සිවිල් තාක්ෂණවේදය | 14 | නර්තනය (භරත) | 53 |
| යාන්ත්‍රික තාක්ෂණවේදය | 15 | පෙරදිග සංගීතය | 54 |
| විදුලිය, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණවේදය | 16 | කර්ණාටක සංගීතය | 55 |
| | | බටහිර සංගීතය | 56 |
| ආහාර තාක්ෂණවේදය | 17 | නාට්‍ය හා රංග කලාව (සිංහල) | 57 |
| කෘෂි තාක්ෂණවේදය | 18 | නාට්‍ය හා රංග කලාව (දෙමළ) | 58 |
| ජෛව සම්පත් තාක්ෂණවේදය | 19 | නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි) | 59 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 20 | ඉංජිනේරු තාක්ෂණවේදය | 65 |
| ආර්ථික විද්‍යාව | 21 | ජෛව පද්ධති තාක්ෂණවේදය | 66 |
| භූගෝල විද්‍යාව | 22 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | 67 |
| දේශපාලන විද්‍යාව | 23 | | |
| තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | 24 | සිංහල | 71 |
| ඉන්දීය ඉතිහාසය | 25A | දෙමළ | 72 |
| යුරෝපා ඉතිහාසය | 25B | ඉංග්‍රීසි | 73 |
| නූතන ලෝක ඉතිහාසය | 25C | පාලි | 74 |
| ගෘහ ආර්ථික විද්‍යාව | 28 | සංස්කෘත | 75 |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | 29 | අරාබි | 78 |
| ව්‍යාපාර සංඛ්‍යානය | 31 | මැලේ | 79 |
| ව්‍යාපාර අධ්‍යයනය | 32 | ප්‍රංශ | 81 |
| ගිණුම්කරණය | 33 | ජර්මන් | 82 |
| බුද්ධ ධර්මය | 41 | රුසියන් | 83 |
| හින්දු ධර්මය | 42 | හින්දි | 84 |
| ක්‍රිස්තියානි ධර්මය | 43 | චීන | 86 |
| ඉස්ලාම් | 44 | ජපන් | 87 |

U.U.A.6.3.2016.AL Paper AD

* ප්‍රධාන විෂය ගණයට අයත් නොවේ. පෙනී සිටින්නේ නම් පමණක් විෂය අංකය කොටුව තුළ ලියන්න.

අංක 8 : ඉල්ලුම්කර ඇති විෂයන් ගණන පැහැදිලිව ඉලක්කමෙන් ලියන්න.

අංක 9 : ජාතික හැඳුනුම්පතේ/වලංගු විදේශ ගමන් බලපත්‍රයේ/ වලංගු රියදුරු බලපත්‍රයේ අංකය ලියා එහි ඡායා පිටපතක් අදාළ කොටුවේ අලවන්න. මෙම ජාතික හැඳුනුම්පතෙහි/වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි/ වලංගු රියදුරු බලපත්‍රයේ ඡායා පිටපත නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන බව ද වැඩි දුරටත් දන්වමි.

අංක 10 : ගෙවන ලද විභාග ගාස්තුව අකුරෙන් හා ඉලක්කමෙන් ලියන්න.

අංක 11 : ස්ත්‍රී/පුරුෂ භාවය
ස්ත්‍රී/පුරුෂ භාවය දැක්වීම සඳහා අදාළ කොටුවේ (X) කතිරයක් යොදන්න.

අංක 12 : ඔබ විභාගයට පෙනී සිටින්නේ කී වෙනි වතාවට දැයි සඳහන් කරන්න.

අංක 13 : **හඳුනාගැනීමේ සහතිකය**
පෞද්ගලික අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍රයේ අත්සන සහතික කළ යුත්තේ, තමා පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් පමණි. ඒ සඳහා ජාතික හැඳුනුම්පතේ හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ හෝ වලංගු රියදුරු බලපත්‍රයේ හෝ ඡායා පිටපතක් රැගෙන යා යුතු ය.

අංක 14 : **ගෙවන ලද ගාස්තු**
විභාග ගාස්තු ගෙවිය යුත්තේ **මුද්දරවලින්** හෝ **මුදල් ඇණවුම්**වලින් නොවේ. විභාග ගාස්තුව වශයෙන් නියමිත මුදල ළඟම ඇති ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගත් කුවිතාන්සිය අංක 14 හි ඇලවිය යුතුයි. 2019 පෙබරවාරි 13 වැනි දින සිට මාර්තු 01 වන දින තෙක් දිවයිනේ සියලු ම තැපැල්/උප තැපැල් කාර්යාලවල මෙම කුවිතාන්සි නිකුත් කිරීම සඳහා විධිවිධාන යොදන ලෙස තැපැල්පති වෙත දන්වා යවා ඇත.

විභාග ගාස්තු විස්තර පහත දැක්වේ.

| විෂය ගණන | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| ගාස්තුව රුපියල් | 150/- | 200/- | 250/- | 350/- | 400/- |

**ගෙවූ ගාස්තු පිළිබඳ කුවිතාන්සිය :**

මුදල් ගෙවූ බවට නිකුත් කර ඇති කුවිතාන්සිය නොගැළවෙන පරිදි නියමිත කොටුව තුළ අලවන්න.

**(මුදල් ගෙවූ කුවිතාන්සියේ අංකය, දිනය අයදුම්කරු විසින් ලියා තබා ගැනීම මැනවි. එහි ඡායා පිටපතක් තබා ගැනීම වඩාත් යෝග්‍යය.)**

**ගෘහ ආර්ථික විද්‍යාව, ඉංජිනේරු තාක්ෂණවේදය හා ජෛව පද්ධති තාක්ෂණවේදය යන විෂයන්ට රු. 300/- බැගින් ද ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ගාස්තු ගෙවිය යුතු ය. එම මුදල ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබූ විට පමණක් ගෙවිය යුතු ය.**

අංක 15 : අයදුම්කරුගේ සහතිකය
සුපරීක්ෂාකාරීව කියවා බලා මෙහි අයදුම්කරුගේ අත්සන යෙදිය යුතු ය.

**දෘෂ්‍යාබාධිත/ශ්‍රවණාබාධිත/වෙනත් විශේෂ අවශ්‍යතා ඇති** අයදුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් කරන අයදුම්පතේ වම් පස උඩ කෙළවරෙහි රතු පාටින් **"දෘෂ්‍යාබාධිත/ශ්‍රවණාබාධිත/වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවෙකි."** යනුවෙන් සඳහන් කළ යුතු ය.

**අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම :**

1. අංක 01 සිට අංක 12 තෙක් විස්තර අයදුම්පත්‍රයේ පළමු පිටුවේ සඳහන් කළ යුතු ය. **එලෙස සකස් නොකරන ලද අයදුම්පත් ද උපදෙස්වලට පටහැනි ලෙස සකස් කර එවන අයදුම්පත් ද නියමිත දිනට පසුව තැපැල් කරන අයදුම්පත් ද විභාග ගාස්තු මුද්දරවලින් හෝ මුදල් ඇණවුම්වලින් හෝ ගෙවා ඇති අයදුම්පත් ද ප්‍රතික්ෂේප කෙරේ.**

2. පෞද්ගලික අයදුම්කරුවන් ලෙස ඉල්ලුම් කළ හැක්කේ පාසලෙන් අස්වී ඇති අයදුම්කරුවන්ට පමණි. පාසලේ ඉගෙනගනිමින් ම පෞද්ගලික අයදුම්කරුවන් ලෙස පෙනී සිටින අපේක්ෂකයින් විභාග තහනමකට ලක් කෙරෙනු ඇත.